
DOI: http://doi.org/10.4038/sljer.v4i2.67

# BOOK REVIEW



Sri Lanka Journal of
Economic Research
Volume 4 (2) June 2017
SLJER.04.02.B:
pp.107-111
Sri Lanka Forum of
University Economists

පාඨලී චම්පික රණවක:
***බලය සහ බලය***
ශ්‍රී ලංකාව: කර්තෘ ප්‍රකාශනය, 2014,
පිටු 319 යි, මිල රුපියල් 500
ISBN 978-955-98843-5-4

***ටී ලලිතසිරි ගුණරුවන්***
*ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය*
ආර්ථික විද්‍යා අංශය, කොළඹ විශ්ව විද්‍යාලය
දුරකථනය: +94 772 28 28 08; ෆැක්ස් : +94 112 58 26 66
විද්‍යුත් තැපෑල: tlgun@econ.cmb.ac.lk

---

## හැඳින්වීම

බලශක්තිය සහ ඒ හරහා උකහා ගන්නා දේශපාලන සහ ආර්ථික බලය පිළිබඳ විමර්ශනාත්මක විග්‍රහයක් ලෙස පාඨලී චම්පික රණවකයන් විසින් රචිත ***බලය සහ බලය*** ග්‍රන්ථය හඳුන්වා දෙනු ලැබිය හැකි ය. බලශක්තිය හා බැඳුණු ඓතිහාසික මෙන්ම විද්‍යාත්මක හා න්‍යායික පදනම පිළිබඳව කෙරෙන විවරණයක් සහ බලශක්තිය තමන් සතු කර ගැනීම තුළින් හා හැසිරවීම ඔස්සේ ලෝකයේ බල තුලනය හා දේශපාලන ආර්ථික දිශානතීන් හැඩගැස්වෙන ආකාරය පිළිබඳව විමර්ශනාත්මක අධ්‍යයනයක් එකම ග්‍රන්ථයක් තුළ කැටිකර දැක්වීමට කර්තෘවරයා ගෙන තිබෙන උත්සාහය මෙහි ප්‍රමුඛ විශේෂීතාවය ලෙස මෙහි ලා නිරීක්ෂණය කෙරෙයි.

ග්‍රන්ථයේ පළමු පැතිකඩ බලශක්තිය පිළිබඳ මූලික අධ්‍යයනයක යෙදෙන විද්‍යාර්ථීන්ට එහි වපසරිය උගැනීමට ඉවහල්වන දැනුම් කෝෂයක් වශයෙන් හඳුන්වා දීම අතිශයෝක්තියක් නොවේ. කර්තෘවරයා තම වෘත්තිය පෘථුලත්වය මෙන්ම ප්‍රතිපත්ති තීරකයකු ලෙස හා දේශපාලඥයකු වශයෙන් ක්ෂේත්‍රය කළමනාකරණය කිරීමේ අත්දැකීම් ඇත්තකු ලෙස කෘතියේ දෙවන පැතිකඩ විග්‍රහ කර ඇති බව පෙනී යයි. විවිධාකාර හේතු හා වාස්තවික තත්ව අනුව පැහැදිලි කිරීමට උත්සහ කළ ද පසුගිය දශක ගණනාවක් පුරා ලෝක දේශපාලනයේ බල ගැන්වීම්, බල පැවැත්වීම් මෙන්ම බල බිඳවැටීම් ද බලශක්ති සාධකය මත තීරණය වී ඇති බව උපුටා පෙන්වීමට කර්තෘ ගෙන ඇති ප්‍රයත්නය කැපී පෙනෙයි.

එ බැවින්, මෙම ග්‍රන්ථය විද්‍යාර්ථීන් ගේ පරිශීලනයට මෙන් ම දේශපාලනික විමසුමට ද ලක් විය යුතු කෘතියක් ලෙස විවරණයට පාත්‍ර විය යුතු ය.

## බලශක්තිය පිළිබඳ විද්‍යාත්මක, තාක්ෂණික හා ඓතිහාසික විවරණය

මෙම ග්‍රන්ථය පරිච්ඡේද දහයකින් සමන්විත වෙයි. කාර්මික විප්ලවය පිළිබඳ කෙරෙන සමාජ ඓතිහාසික විවරණයකින් එම පරිච්ඡේදයන්ට පසුබිම සකසනු ලැබ ඇත. ශක්තිය, විදුලිය, පොසිල ඉන්ධන, දේශගුණික විපර්යාසයන් වැනි විද්‍යාත්මක හා මූලික තාක්ෂණික කරුණු ඊට අදාළ පරිශීලනයන් හා පර්යේෂකයන් ද සමාජ ආර්ථික අනුවර්තනයේ ඊට අදාළ සන්ධිස්ථානයන් හා කාලවකවානු ද සමඟ ඉදිරිපත් කිරීමක් මුල් පරිච්ඡේද හතර තුළ අන්තර්ගත වෙයි. එම පරිච්ඡේද වල අඩංගු කරුණු විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ හදාරන විද්‍යාර්ථීන්ගේ දැනුම් නිම්වළලු පුළුල් කිරීමට මෙන් ම කුතුහලය උද්දීපනය කිරීමට ද උපස්ථම්භක වෙයි. න්‍යෂ්ටික බලය සහ එහි උපයෝජනය පිළිබඳව මෙන්ම පුනර්ජනනීය බලශක්තිය ගැන සඳහන් කෙරෙන පස්වන සහ සයවන පරිච්ඡේද වඩාත් වැදගත් වන්නේ විවිධ විද්‍යාඥයන්ගේ මතිමතාන්තර හා කල්පිත කලින් කලට එළි දකින නවෝත්පාදන තුළින් වඩා තහවුරු කෙරෙන සහ ප්‍රතික්ෂේප කෙරෙන අයුරු විමර්ශනාත්මකව ඉදිරිපත් කර ඇති ආකාරයෙනි.

න්‍යෂ්ටික බලය පිළිබඳ කෙරෙන විග්‍රහය ඉතා සුවිශේෂී වෙයි. න්‍යෂ්ටික ශක්තියේ ප්‍රායෝගිකත්වය, බහුතර ජනතාවක් දිළිඳු කමින් මුදවා ගැනීමේ දී අත්‍යවශ්‍ය වන්නා වූ බලශක්තිය නිපදවා ගැනීම හමුවේ න්‍යෂ්ටික ශක්තියෙන් ලබා ගත හැකි සමාජ-ආර්ථික වාසි, කාබන් විමෝචනයට ඉන් ලැබෙන පිළිතුරු වැනි පැතිකඩ පමණක් නොව අපද්‍රව්‍ය හා අවදානම වැනි න්‍යෂ්ටික බලශක්තිය භාවිතා කිරීමේ ඇති අවාසි ද මෙහි ලා මනා කොට විමසුමට ලක්කරනු ලැබ තිබේ. ශ්‍රී ලංකාවේ අප න්‍යෂ්ටික බලශක්තිය කෙරෙහි කවර ආකල්පයක් දැරිය යුතු ද යන්න පිළිබඳව ඉතා ආකර්ෂණීය විග්‍රහයක් මෙම පරිච්ඡේදයේ අඩංගු වේ. න්‍යෂ්ටික බලශක්තිය කරා නො යාම තුළ එහි ප්‍රතිලාභ අත් නො විඳිමින් ම අසල්වැසි ඉන්දියාවේ වෙරළාසන්න කලාපයන් හි පිහිටා ඇති න්‍යෂ්ටික බලාගාර නිසා න්‍යෂ්ටික බලශක්තියේ හානිදායක ඉරණම් වලට නිතැතින්ම ලක් වීමේ අවදානමට මුහුණ දීමට සිදුව ඇති බව පාඨකයාට ඒත්තු යන්නේ ඉබේම ය. තව ද, සන්නිවේදන තාක්ෂණය හා ඒ හරහා කැටි කෙරෙන යුද උපාය ශක්තිය මෙන් ම ශූන්‍යය පිළිබඳව හා ''අඳුරු ශක්තිය'' පිළිබඳව කෙරෙන හඳුන්වාදීම් අධ්‍යාපනික වශයෙන් පාඨක පෝෂණයට ද ඉවහල් වෙයි.

කාලීන වශයෙන් ඉතා වැදගත් තේමාවක් වන පුනර්ජනනීය බලශක්තීන් පිළිබඳව කෙරෙන විමර්ශනය ද පාඨක අවධානයට යොමු විය යුතු ය. විශේෂයෙන්ම සුළං බලය, ජෛව ස්කන්ධ බලය හා සූර්ය ශක්තිය වර්තමාන දේශපාලන-ආර්ථික සන්දර්භය තුළ පිහිටුවා සාකච්ඡා කරනු ලැබ තිබේ. මෙම පුනර්ජනනීය බලශක්ති උපයෝගී කර ගැනීමේ හැකියාව හා පිරිවැය පාඨකයන්ගේ විමර්ශනාත්මක ප්‍රශ්න කිරීමට ලක් වෙනු ඇත. නිදසුනක් වශයෙන් සුළං විදුලි ඒකකය තවමත් ගල් අඟුරු තරම් ලාභ නොමැති බවට මෙම ග්‍රන්ථයේ ප්‍රකාශ වුව ද මෑත දී කරන ලද විද්‍යාත්මක ඇගැයීම අනුව දැනටමත් සුළං බල ඒකකයක ආර්ථික පිරිවැය ගල් අඟුරුවලින් ජනනය කෙරෙන ඒකකයකට වඩා අඩු බව නිරීක්ෂණය කරනු ලැබ තිබේ. එමෙන්ම, දේශීයත්වයේ ආර්ථික අගය එකතු කිරීම තුළ ජෛව ස්කන්ධ බලශක්තියට ද ආනයනික බලශක්තියකට වඩා වැඩි ආර්ථික වටිනාකමක් නුදුරේ දී ම හිමි වනු ඇත. එ බැවින්, බලශක්ති සුරක්ෂිතතාව හා බලශක්ති විශ්වාසනීයත්වය කරා පාඨකයා ගෙන යාමට ද කර්තෘ පියවර ගත්තේ නම් මෙම කෘතිය මීටත් වඩා සාර්ථක වීමට ඉඩ තිබූ බව මගේ අදහසයි.

## බලශක්තිය පිළිබඳ දේශපාලන-ආර්ථිකය

මෙම ග්‍රන්ථයේ වඩාත්ම ආකර්ෂණීය කොටසට පාඨකයා අවතීර්ණ කෙරෙනුයේ බලශක්තිය පිළිබඳ දේශපාලනික හා ආර්ථික කරුණු සම්බන්ධයෙන් සත්වන පරිච්ඡේදයේ කෙරෙන විමසුම හා ශ්‍රී ලංකාවේ බලශක්තිය පිළිබඳව සාකච්ඡා කෙරෙන අටවන පරිච්ඡේදයේ අන්තර්ගතය තුළිනි. *"ලොව කවර ආර්ථික රටාවක්, සමාජ රටාවක් හෝ දේශපාලන රටාවක් ක්‍රියාත්මක වුව ද ආර්ථික බලය, සමාජ බලය හා දේශපාලන බලය පවත්වා ගැනීමට හා වැඩි දියුණු කර ගැනීමට නූතන ලෝකයේ ප්‍රධානතම සාධකය බවට පත් ව ඇත්තේ බලශක්තියයි. ලොව පොසිල ඉන්ධන හා එසේ නොවන ශක්ති ප්‍රභව පාලනය කරන්නේ කවුරුන් ද, ඔවුන් ලොව පාලනය කරන්නන් බවට පත්ව තිබේ"*යනුවෙන් කර්තෘ විසින් කරනු ලබන්නේ ඉතා ප්‍රබල ප්‍රකාශයකි. එමෙන් ම, එම ප්‍රකාශය බලශක්ති දේශපාලන ආර්ථිකය පිළිබඳ අපේ දේශීය දැක්ම සකසා ගැනීමේ දී නොසලකා හැරිය නො හැකි පැතිකඩක් විවර කිරීමකි. විශේෂයෙන්ම මන්නාරම් ද්‍රෝණියේ පොසිල ඉන්ධන ගවේෂණය කෙරෙමින් පවත්නා අවස්ථාවක අප විසින් ආරක්ෂාකාරී විය යුතු අවදානම් සහගත දිශානතීන් පිළිබඳව කහ එළි හා රතු එළි දල්වන අනතුරු ඇඟවීමකි.

ලෝක දේශපාලනයේ බලශක්ති අයිතියට පවත්නා පොරය පිළිබඳව මෙම ග්‍රන්ථයේ කෙරෙන විමර්ශනයට අනුව ශ්‍රී ලංකාවෙන් පොසිල ඉන්ධන හමු නො වුණ හොත් එය රටේ වාසනාවක් වනු ඇතැයි සිතෙන තරමට විමසුම් බුද්ධියට ආමන්ත්‍රණය කිරීමට කතුවරයා පියවර ගෙන ඇති බව පෙනේ. එසේ ම, අනාගතය පිළිබඳව උපාය මාර්ගික දැක්මක් නොමැතිව හා පසුගිය ශතවර්ෂය තුළ පොසිල ඉන්ධන ආධිපත්‍ය වෙනුවෙන් බලවතුන් කළ බලපෑම් හෝ ඇතැම් විටෙක රාජ්‍ය පෙරළි පිළිබඳව මනා වැටහීමක් නොමැතිව ශ්‍රී ලංකාව මෙම පොසිල ඉන්ධන සෙවීමට පිවිසෙන්නේ නම් එය අන්‍ය ජාතීන් රැ වැටුණු වළේ අප දවල් ද වැටීමටකට වඩා වැඩි යමක් නො වනු ඇති බව අවබෝධ කර ගැනීම දක්වා පාඨකයා යොමු කරවීමට ද හෙතෙම සමත් වී ඇත.

## අතීත අත්දැකීම් තුළින් අනාගතයට උපාය මාර්ගික ප්‍රවේශයක්

සෝවියට් දේශයේ නැගීම මෙන්ම වැටීම ද, චීනය ආර්ථික බලවතකු වීමේ පෙරගමන ද, බ්‍රිතාන්‍යයේ හා කැලිෆෝනියාවේ බලශක්ති දේශපාලනය ද කර්තෘවරයාගේ විමසුමට ලක් වන්නේ හුදෙක් අතීත පුරාවෘත්තයන් පිළිබඳව කෙරෙන විග්‍රහයකට වඩා අනාගතය පිළිබඳව දැක්මක් සකසා ගැනීමට අවශ්‍ය පාදක කරුණු ඉස්මතු කිරීමක් වශයෙන් බව පෙනී යයි. ඒ අනුව, ජාත්‍යන්තර දේශපාලනය තුළ ***කියොතෝ එකඟතා*** බිඳ වැටීම මෙන්ම ජී77 කණ්ඩායමේ අවශ්‍යතාවන් හා ජී8 කණ්ඩායමේ ඕනෑ එපා කම් බලශක්තිය හමුවේ ගැටෙන අයුරු ද අනාගත දැක්මේ පැතිකඩක් ලෙස ගැනීම ඉතා වැදගත් වනු ඇත.

ඛනිජ තෙල් කර්මාන්තයේ උපාය මාර්ගික වැදගත්කම සලකා සිරිමාවෝ බණ්ඩාරනායක රජය විසින් 1960-1965 කාලවකවානුවේ දී විදේශීය තෙල් සමාගම් ජනසතු කර ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව බිහි කිරීම කතුවරයාගේ විශේෂ ඇඟැයීමට ලක් වෙයි. රටේ ඉදිරි දැක්ම තුළ ඛනිජ තෙල් පිරිපහදුව ඉදිකරගත් ආකාරය හා ඊට බටහිරයන්ගේ තිබූ නො කැමැත්ත ද, ජාත්‍යන්තරව බණ්ඩාරනායක මැතිනියට තිබූ ප්‍රතිරූපය නිසා ඇය පිළිබඳව කෝපයෙන් සිටි පිරිස් වලට ඇයව විනාශ කරලීමට නොහැකි වූ අයුරු ද, රටේ අනාගතය ගැන විමර්ශනාත්මකව අවධානය යොමු කරන්නවුන්ට ගෝචර වන පරිදි උපුටා දක්වනු ලැබ ඇත. 1962 දී ඇති වූ හමුදා කුමන්ත්‍රණය පිටුපස ෂෙල්, කැල්ටෙක්ස් හා මොබිල් වැනි බහුජාතික තෙල් සමාගම් සිටි බවට පවත්නා කසුකුසුව හුදු කට කතාවක් නො වන බව ලොව සිදුවීම්

වලින් පෙන්නුම් කෙරෙන බව කර්තෘ කියයි. තෙල් ජනසතුව නිසා කුපිත වූ එක්සත් ජනපදය ඒ වන විට එහි ඉගෙනුම ලබමින් සිටි ශ්‍රී ලාංකික උපාධි අපේක්ෂක සිසු සිසුවියන්ගේ ශිෂ්‍යත්ව අවලංගු කිරීමට පවා අමානුෂික වූ බව ටී.බී. ඉලංගරත්න මුදල් ඇමතිවරයා විසින් සිය 1963 අයවැය කතාවේදී කරන ලද අනුවේදනීය සඳහන ද මෙම ග්‍රන්ථයට ඇතුළත් වූයේ නම් කර්තෘවරයා විසින් ගෙඩ නැගීමට යත්න දරන ලද බව පෙනෙන පින්තූරය වඩාත් සම්පූර්ණ වීමට ඉඩ තිබූ බව මගේ වැටහීමයි.

### ශ්‍රී ලංකාවේ විදුලි බල අර්බුදය හා රාජ්‍ය ආයතන කළමනාකරණය

ග්‍රන්ථයෙහි නව වන පරිච්ඡේදය වෙන් කරනු ලැබ ඇත්තේ ශ්‍රී ලංකාවේ විදුලි බලයේ මූල්‍ය අර්බුදය ගැන කතා කිරීමට ය. ආර්ථික වශයෙන් ඉතා ශක්තිමත්ව තිබුණු ලංකා විදුලි බල මණ්ඩලය 1996 සිට ක්‍රමයෙන් මූල්‍ය අර්බුදයට යාම හා ඊට පාදක වුණු ප්‍රතිපත්තිමය හා උපාය මාර්ගිකමය වැරදි මෙන් ම දූෂණ පිළිබඳව ද කෙරෙන විවෘත සාකච්ඡාවකින් මෙම පරිච්ඡේදය සමන්විත වෙයි. ඉදිරි කාලයේ දී ශ්‍රී ලංකාව විදුලි බල අර්බුදයකට මුහුණ දීම වැළැක්වීම සඳහා සහ සාධාරණ වූ විදුලි බල ගාස්තුවක් සහිතව සේවා සපයන්නාගේ ආර්ථිකය ද සවිබල ගැන්වීම සඳහා වන ප්‍රතිපත්ති දැක්මකට පාඨකයා අවතීර්ණ කෙරෙයි.

ප්‍රතිසංස්කරණ හා ප්‍රතිව්‍යුහගතකිරීම් වල ගුණාගුණ සාකච්ඡා කිරීම ද මෙහි ලා කැපී පෙනෙන කරුණකි. එහෙත්, නො කියැවෙන කරුණක් ද ඇත. එනම්, දේශපාලන හස්තයෙන් ආයතන ක්‍රියාකාරීත්වය හා කළමනාකාරීත්වය මුදවා ගැනීමේ ව්‍යුහාත්මක වෙනසකට ලංකා විදුලි බල මණ්ඩලය හෝ වෙනත් කිසිඳු රාජ්‍ය ආයතනයක් මෙතෙක් අවතීර්ණ වී නොමැති බවයි. එසේ නොවන තාක් ප්‍රතිව්‍යුහගතකරණයෙන් හෝ කොටස් කිරීමෙන් හෝ රාජ්‍ය ආයතන වල මූල්‍ය-ආර්ථික ශක්‍යතාවයේ තිරසාරත්වය තහවුරු කළ නො හැකි වෙයි.

රාජ්‍ය අංශයේ ප්‍රතිපත්තිමය තිරණ ගැනීමේ වගකීම හා බලය දේශපාලනය සතු වීමේ ගැටලුවක් නොමැත. ගාස්තුව තීරණය කිරීම ප්‍රතිපත්තිමය කරුණකි. ඒ සඳහා විනිවිද පෙනෙන හා අනම්‍ය සමීකරණයක් අනිවාර්යයෙන් තිබිය යුතුය යන කරුණ විමසීමට ලක් විය යුත්තේ එවැනි තත්වයක් තුළ ප්‍රතිපත්තිමය මැදිහත් වීමකට ඇති ඉඩකඩ ඇහිරීම සුදුසු නොවන බැවිනි. කෙසේ වෙතත් දේශපාලකයා විසින් ප්‍රතිපත්ති තීරණ ගැනීමේ දී හුදෙක් ගාස්තු තීරණය කරමින් දේශපාලන වාසි ලබා ගැනීමෙන් පමණක් නතර වීම වළක්වාලීම ද ඉතා වැදගත් ය. ප්‍රතිපත්තිමය මැදිහත් වීම අනුව ගාස්තු දේශපාලනිකව තීරණය වන විට ඒ නිසා පිරිවැය මත පදනම්ව නිෂ්පාදකයා වෙත අයවිය යුතු ආදායමෙන් අහිමි වී යන කොටස පිළිබඳව නොදුටු ඇස් ව නොඇසූ කන් ව සිටීමට ද දේශපාලකයාට නොහැකි විය යුතු ය. ඒ හිඩැස පිරවීම සඳහා අවශ්‍ය මූල්‍ය ගැළපුම් දීමනාවන් නිෂ්පාදකයාට රාජ්‍ය යන්ත්‍රණය වෙතින් ලැබීම තහවුරු කිරීමේ දේශපාලනික ප්‍රතිපත්ති ක්‍රමවේදයක් ද අත්‍යවශ්‍ය වේ. ගාස්තු තීරණය කිරීමේ දී කෙසේ වෙතත් අවම වශයෙන් එවැනි ගැළපුමක් හෝ හිඩැස පියවීමක් හමුවේ දී වත් කර්තෘ විසින් යෝජිත විනිවිද පෙනෙන පිරිවැය සමීකරණයක් වැදගත් වන්නේ එබැවිනි.

### සමාප්තිය

ග්‍රන්ථය අවසන් කෙරෙනුයේ අනාගත විසඳුම් සාකච්ඡා කෙරෙන දසවැනි පරිච්ඡේදයෙනි. බලශක්ති සම්පත් අත්පත් කර ගැනීමේ වියරු යුද්ධයෙන් බේරීමේ උපාය මාර්ග සෙවීමට මේ තුළින් පාඨකයා යොමු කෙරෙයි. ඒ සේ ම, ඒ හමුවේ ශ්‍රී ලංකාවට ආවේනික වූ දුර්වලතා ද සැකෙවින් සාකච්ඡා කෙරෙයි. පටු පක්ෂග්‍රාහී දේශපාලන තීන්දු, නීතිය හා සංස්ථාමය රාමුව බිඳ වැටී තිබීම, ගෝත්‍රික කල්ලි වාදය, ජවාරම් මිස ආයෝජන සැලසුම් අනුව මෙහෙයවීමක්

නො කෙරෙන සංවර්ධන උපාය තීරණ, වෘත්තියවේදීන්ගේ පලා යාම වැනි කරුණු තමන් ද අමාත්‍ය මණ්ඩල සාමාජිකත්වය දැරුවා වූ සහ දරන්නා වූ තත් කාලීන මෙන් ම වර්තමාන රාජ්‍ය කළමනාකරණයන්ට එල්ල කෙරෙන සියුම් ප්‍රහාරයන් ලෙස ද නිරීක්ෂණය කරනු ලැබිය හැකි ය. ඒ අනුව, පවත්නා සන්දර්භයන් තුළ කර්තෘ ගේ ඉදිරි දේශපාලනික පැවැත්ම හා හැසිරීම කවරක් වනු ඇති ද යන්න පාඨකයා තුළ මෙන් ම අදාළ පාර්ශව තුළ ද ප්‍රශ්න ලෙස පැන නැගෙනුයේ නිතැතිනි. ඒ සේ ම, එම තත්වයන් නිවැරදි කිරීමට කර්තෘ විසින් යම් පියවරක් ඉදිරියේ දී ගනු ඇති ද, ඒ සේ නම් ඒ කවරක් විය හැකි ද, යන ගැටලු පිළිබඳ කුතුසක් දේශපාලන ක්ෂේත්‍රය තුළ ජනනය කිරීමට ද කෘතියේ එන මෙම විමැසුම ම පාදක වන බව ද ඉතා පැහැදිලි ය.

විමර්ශනාත්මක ප්‍රතිපත්ති හා උපාය මාර්ගික කරුණු සාකච්ඡා කෙරෙන දාර්ශනික ග්‍රන්ථයක් වශයෙන් මෙන් ම ප්‍රස්තුතයට අදාළ විෂය කරුණු විද්‍යාත්මකව විමැසෙන අධ්‍යාපනික සංග්‍රහයක් ලෙස ද මෙම ග්‍රන්ථය පාඨක සමාජයේ ඇගැයීමට ලක් වීමට ඇති ඉඩ කඩ ඉතා ඉහළ බව මගේ විශ්වාසයයි.